සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2024

# බුද්ධ ධර්මය

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයः |
|---|

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Learning Resource Centre
De Mazenod College
Kandana

01. බුදුරජාණන් වහන්සේට වැළඳුණු මාරාන්තික රෝගය වූයේ,
(1) උණ සන්නිපාතය (2) හිසේ කැක්කුම
(3) ලෝහිත පක්ඛන්දිකා රෝගය (4) භගන්දරා රෝගය

02. බුද්ධ මාතා යන ගරු නාමයෙන් හඳුන්වනු ලැබුයේ,
(1) යශෝදරා දේවිය (2) මහාමායා දේවිය
(3) මහා ප්‍රජාපතී ගෝතමී දේවිය (4) කිසාගෝතමිය

03. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය පිරිනිවන් පා වදාළේ,
(1) අවුරුදු 80 දී (2) අවුරුදු 70 දී
(3) අවුරුදු 100 දී (4) අවුරුදු 120 දී

04. නරසීහ ගාථා කියමින් බුදු සිරුර වර්ණනා කළේ,
(1) කිසාගෝතමිය (2) මහාමායා දේවිය
(3) යශෝදරා දේවිය (4) ප්‍රජාපති දේවිය

05. බුදුරදුන් බුද්ධත්වයෙන් නව වන මස යක්ෂයන් දමනය කිරීම සඳහා වැඩම කළේ,
(1) කැලණියට (2) මහියංගණයට
(3) මුතියංගණයට (4) නාගදීපයට

06. සිදුහත් කුමරු ආනාපානසති භාවනාව වඩන ලද්දේ,
(1) බෝමැඩ දී (2) රාජමාලිගයේ දී
(3) දඹරුක් සෙවණේ දී (4) ගිජුකුළු පව්වේ දී

07. බුදුන් වහන්සේ චන්දකින්නර ජාතකය වදාළේ,
(1) යශෝදරා දේවියට (2) මහා ප්‍රජාපති ගෝතමියට
(3) කිසාගෝතමියට (4) සාමාවතී බිසවට

08. බුද්ධ ශාසනයේ දීර්ඝ කාලීන අත්දැකීම් ඇති භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත්කරන ලද්දේ,
(1) යශෝදරා දේවිය (2) මහා ප්‍රජාපතී ගෝතමිය
(3) කිසාගෝතමිය (4) රජ්ජුමාලාව

09. ශාක්‍ය සහ කෝලිය වංශිකයන් අතර ගැටුමක් ඇති වූයේ,
(1) රෝහිණී නදියේ ජලය බෙදාගැනීමට (2) ගංගා නදියේ ජලය බෙදාගැනීමට
(3) යමුනා නදියේ ජලය බෙදාගැනීමට (4) අචිරවතී නදියේ ජලය බෙදාගැනීමට

10. ආශ්වාස වාතය, ප්‍රශ්වාස වාතය අරමුණුකොටගෙන කෙරෙන භාවනාව වන්නේ,

(1) සමථ භාවනාව (2) විදර්ශනා භාවනාව

(3) ආනාපානසති භාවනාව (4) මෛත්‍රී භාවනාව

11. ''තුන් සරණය'' ගායනය යනු,

(1) පැල්කවිවලට අයත් වූවකි. (2) වන්දනා ගමන්වලදී යොදාගත් කවි පොතකි.

(3) වන්දනාමාන කළ යුතු ස්ථාන 3 කි. (4) ශ්‍රද්ධාව ජනනය නොවන කවි පෙළකි.

12. අටමස්ථානය පිහිටියේ,

(1) අනුරාධපුරයේ ය. (2) පොළොන්නරුවේ ය.

(3) බදුල්ලේ ය. (4) දඹදෙණියේ ය.

13. බුදුරදුන්ගේ ඌර්ණ රෝම ධාතුව නිදන්කොට සාදවන ලද චෛත්‍යය වන්නේ,

(1) කතරගම කිරි වෙහෙර (2) මිහින්තලේ සේල චෛත්‍යය

(3) රුවන්මැලි මහා සෑය (4) මුතියංගණ චෛත්‍යය

14. ත්‍රිවිධ ශික්ෂාවට අයත් වන්නේ,

(1) බුද්ධ, ධම්ම, සංඝ (2) ප්‍රඥා, සීල, සමාධි

(3) තණ්හා, සෘද්ධි, මාන (4) අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥා

15. ආර්ය මහා සංඝරත්නය සෘජු අදහස් ඇති අවංක පිළිවෙත් අනුගමනය කරන නිසා,

(1) සුපටිපන්න නම් වේ. (2) උජුපටිපන්න නම් වේ.

(3) ඤායපටිපන්න නම් වේ. (4) අඤ්ජලිකරණීය නම් වේ.

16. බුදුරජාණන් වහන්සේගේ අසහාය රූප විලාසය පිළිබඳ ව වර්ණනා කළ බ්‍රාහ්මණයා,

(1) සෝණදණ්ඩ (2) සටීකාර

(3) සහම්පතී (4) සච්චක

17. බුදුරදුන්ගේ රූ සපුව බලා සිටීමේ ආශාවෙන් පැවිදි වූ භික්ෂුව වන්නේ,

(1) නන්ද හිමියන් (2) ඡන්න හිමියන්

(3) වක්කලී හිමියන් (4) අනඳ හිමියන්

18. සම්බුද්ධ පරිනිර්වාණය ලොවට ම දැනුම් දීමට මෙන්,

(1) මහා වැස්සක් ඇතිවිය. (2) මහ පොළොව කම්පා විය.

(3) සියලු ගස්වල මල් පිපුණේ ය. (4) මහා කුණාටුවක් හමා ගියේ ය.

19. අකම්පිත බව යනු,

(1) කරුණික බව (2) නම්‍යශීලී බව

(3) අටලෝ දහමට කම්පා නොවන බව (4) අවංකව බව

20. බුදුරදුන් පිරිනිවීමට පෙර රහත් වන්නේමැයි අදිටන් කර ගත්තේ,

(1) ආනන්ද හිමි (2) නන්ද හිමි

(3) ධර්මාරාම හිමි (4) අස්සජි හිමි

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (1) බුදුරජාණන් වහන්සේ අවසන් වස්කාලය ගතකළේ කොහේදී ද?

(2) සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූයේ කිනම් ස්ථානයක ද?

(3) බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ 4 ක් ලියන්න.

(4) ''යථාවාදී තතාකාරී'' ගුණය හඳුන්වන්න.

(5) සංඝරත්නය වෙනුවෙන් ගිහියන් ඉටුකළ යුතු යුතුකම් 2 ක් ලියන්න.

(6) යශෝදරා දේවිය හඳුන්වන ලද අනෙක් නම කුමක් ද?

(7) ''කරන කලට පව් මීරිය මීසේ'' යන කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?

(8) සිව් බඹ විහරණ නම් කරන්න.

(9) සඟ ගුණ ගණන කීය ද?

(10) බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂු සංඝයාට 'සූකර මද්දවය' නම් විශේෂ ආහාරය පිළිගැන්වූයේ කවුරුන් විසින් ද?

(ලකුණු 2 x 10 = 20)

02. (1) 'චතු අප්පමඤ්ඤා' යනුවෙන් කුමක් අදහස් වේ ද?

(2) අනුන්ගේ දියුණුව දැක ඒ පිළිබඳ ව තමන්ගේ දියුණුවක් ලෙස සිතා සතුටුවීම සිව්බඹ විහරණවලින් කිනම් ගුණයකට අයත් ද?

(3) එම ගුණය පිළිබඳ ව කෙටියෙන් හඳුන්වා දෙන්න.

(ලකුණු 10)

03. (1) අභිඥාලාභීන් අතර අග්‍රස්ථානය හිමි වූයේ කවුරුන්ට ද?

(2) චන්දකින්නර ජාතකය බුදුන් වහන්සේ විසින් දේශනා කළේ කාහට ද?

(3) ''කැලේ තිබෙන කොයි දේවත් රස වේවා''

''මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා !''

යන කවිය ඇතුළත් පද්‍ය ග්‍රන්ථය කුමක් ද? එහි ඉතිරි පද සම්පූර්ණ කරන්න.

(ලකුණු 10)

04. (1) සිහියෙන් හුස්ම පිහිටුවාගෙන කෙරෙන භාවනාව කුමක් ද?

(2) භාවනාවෙන් මානසික දියුණුවට හේතු වන කරුණු කෙටියෙන් පහදන්න.

(3) භාවනාවට පෙර සූදානම කෙසේ විය යුතුද? (ලකුණු 10)

05. (1) සොළොස්මස්ථාන නම් කරන්න.

(2) දෙසැම්බර් මස සිට ඊළඟ වසරේ මැයි දක්වා කාලයේ වැඳුම් පිදුම් කරන්නේ කිනම් සිද්ධස්ථානයකට ද?

(3) බුදුරදුන්ගේ ලලාට ධාතූන් වහන්සේ තැන්පත්කොට සැදූ චෛත්‍යය කුමක් ද?

(ලකුණු 10)

06. (1) "සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා" යන කවිය සම්පූර්ණ කරන්න.

(2) මෙම කවිය අඩංගු ග්‍රන්ථය කුමක් ද?

(3) සුපටිපන්න පාඨයෙහි ඇතුළත් සඟ ගුණ පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 10)

07. (1) "යථාකාරී තථාවාදී යථාවාදී තථාකාරී" යන්නෙහි තේරුම ලියන්න.

(2) බුදුරජාණන් වහන්සේගේ නායකත්ව ගුණයේ ලක්ෂණ 3 ලියන්න.

(3) බුදුන් වහන්සේගේ නායකත්ව ලක්ෂණ තුළින් තම ජීවිතය සකස්කර ගත හැකි අයුරු කෙටියෙන් පහදන්න. (ලකුණු 10)